# කෞතුකාගාර ප්‍රවර්ධන උපාය මාර්ගයක් වශයෙන් තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීමේ වැදගත්කම : සීගිරිය කෞතුකාගාරය ඇසුරින්

**ආර්.එම්.එම්.එම්. රණසිංහ**
සීගිරිය ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, සීගිරිය.
rm.malsharanasinghe@gmail.com

ප්‍රමුඛ පද : කෞතුකාගාර, ප්‍රවර්ධනය, තාවකාලික ප්‍රදර්ශන

**හැඳින්වීම**

1974 වර්ෂයේ දී ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය මඟින් කෞතුකාගාර යනු කුමක් ද යන්න අර්ථ නිරූපණය කර තිබේ. මෙම අර්ථ නිරූපණයට අනුව, "මිනිසා හා ඔහුගේ පරිසරය පිළිබඳ ද්‍රව්‍යමය සාක්ෂි අත්පත් කරගන්නා වූ, සංරක්ෂණය කරන්නා වූ, පර්යේෂණ පවත්වන්නා වූ හා ප්‍රදර්ශනය කරන්නා වූ ද, මහජනයාගේ අධ්‍යයනයට, අධ්‍යාපනය හා සංතුෂ්ටිය සඳහා විවෘත ව පවතින, සමාජ සේවයට හා දියුණුවට පවත්වාගෙන යනු ලබන, ලාභ නොලබන ස්ථිර ආයතන කෞතුකාගාර" වශයෙන් හඳුන්වා දී තිබේ (හේවගේ 2003). මෙම නිර්වචනයට අනුකූලව බලන කල්හි කෞතුකාගාර යනු හුදෙක් භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම පමණක් සිදුකරනු ලබන ආයතනයක් නොවන බව පැහැදිලිය.

උක්ත සඳහන් කරනු ලැබූ කෞතුකාගාර කාර්යභාරය තුළ ප්‍රදර්ශන පැවැත්වීම ප්‍රධාන ස්ථානයක් ගනී. මෙම ප්‍රදර්ශනයන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම් ස්ථිර ප්‍රදර්ශන හා තාවකාලික ප්‍රදර්ශන වශයෙනි. නූතන ලෝකයේ කෞතුකාගාර සංකල්පය ඔස්සේ ක්‍රියාත්මකවන මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් සීගිරිය කෞතුකාගාරය තුළ ද ස්ථිර ප්‍රදර්ශන කුටි වලට අමතර ව තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීම ආරම්භ කරන ලද්දේ හිටපු කෞතුකාගාර අධ්‍යක්ෂ වරයෙකු වූ සිරිනිමල් ලක්දුසිංහ මහතාගේ සංකල්පයකට අනුකූලව ය. කෞතුකාගාර ප්‍රවර්ධන උපාය මාර්ගයක් වශයෙන් තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීමේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වන අතර, කෞතුකාගාර නිර්වචනය තුළින් අදහස් වන්නා වූ මහජනයාගේ අධ්‍යයනයට, අධ්‍යාපනයට හා සංතුෂ්ටියට මෙන් ම පර්යේෂණ පැවැත්වීමට තාවකාලික ප්‍රදර්ශන කොතෙක් දුරට ඉවහල්වන්නේ ද යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

**අධ්‍යන ක්‍රමවේදය**

තාවකාලික ප්‍රදර්ශන සඳහා තේමාවන් තෝරාගැනීම, ප්‍රදර්ශන සැළසුම්කරණය හා ප්‍රේක්‍ෂක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන ක්‍රමවේදය වේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

සීගිරිය කෞතුකාගාරය තුළ ඇති ස්ථිර ප්‍රදර්ශනයට අමතර ව සීගිරිය ප්‍රදේශයට අදාළ තේමාවන් ඔස්සේ හා වෙනත් විවිධ තේමාවන් ඔස්සේ තාවකාලික ප්‍රදර්ශන සංවිධානය කරනු ලබයි. දැනට එසේ පැවති ප්‍රදර්ශන අතර සීගිරිය ප්‍රදේශයේ දඩයම් ක්‍රම, සාම්ප්‍රදායික මුළුතැන්ගෙයි උපකරණ, සාම්ප්‍රදායික කලාවන්, සාම්ප්‍රදායික ඇසුරුම් ක්‍රම, සාම්ප්‍රදායික ජන ජීවිතය හා මැටි බඳුන් තාක්‍ෂණය මෙන් ම සීගිරියෙහි පැරණි ඡායාරූප, විවිධ විදේශීය ප්‍රභූන්ගේ සීගිරි ආගමනයන් දැක්වෙන ඡායාරූප, ජපානයේ කියොතෝ කෞතුකාගාරය හා ඒකාබද්ධ ව පැවති ජපන් ජාතික චිත්‍ර ශිල්පී ටෙට්සුරෝ සුජිමොතෝ විසින් 1932 පිටපත් කළ සීගිරි චිත්‍රවල පිටපත්, ආචාර්ය ලූසියානෝ මරෙන්සි විසින් 1967 දී සීගිරි චිත්‍ර යථාවත් කිරීම ඇතුළු දුර්ලභ ඡායාරූප එකතුවේ ප්‍රදර්ශනය, ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු, ලොතරැයි, මුද්දර වල සීගිරිය අන්තර්ගත තිබූ අන්දම, සීගිරිය එදා සහ අද යන මාතෘකාවක් ඔස්සේ පැවති ප්‍රදර්ශන ඉන් කිහිපයකි.

තාවකාලික ප්‍රදර්ශන සැළසුම් කරනු ලබන්නේ සය මාසික කාල සීමාවකට සීමාවන පරිදි ය. පූර්ව පුස්තකාල ගවේෂණයකින් අනතුරු ව අත්පත් කර ගන්නා භාණ්ඩ පිළිබඳ ව තීරණය කරනු ලබයි. ක්‍ෂේත්‍ර ගවේෂණය මඟින් අත්පත් කරගත හැකි භාණ්ඩ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අනතුරුව ප්‍රදර්ශනය සඳහා ප්‍රමාණවත් භාණ්ඩ පවතීනම් පමණක් අදාල මාතෘකාව ඔස්සේ ප්‍රදර්ශනය පැවැත්වීමට තීරණය කරනු ලැබේ.

භාණ්ඩ අත්පත් කරගැනීමේ දී ඒ සඳහා කෙටි කාලීන ව ලබා දීමේ ගිවිසුමක් යොදා ගනී. පිළියෙල කර ඇති ආකෘති පත්‍රය පුරවා එහි පිටපතක් භාණ්ඩ හිමිකරුට ලබා දී විධිමත් ආකාරයෙන් භාණ්ඩ අත්පත් කරගැනීම සිදුකරනු ලැබේ. අත්පත් කර ගන්නා භාණ්ඩ කෙබඳු තත්ත්වයක පැවතිය ද කිසිදු අලුත්වැඩියාවකට හෝ නව කොටස් එකතුකිරීම කිසි විටෙකත් සිදු නොකරන අතර, අත්පත් කරගත් ආකාරයටම ප්‍රදර්ශනය කරනු ලැබේ.

සීගිරිය කෞතුකාගාරය තුළ තාවකාලික ප්‍රදර්ශන සැළසුම් කිරීමේ දී ඡායාරූප ප්‍රදර්ශනය සඳහා සංචාරක අනුස්ථාපන කලාපය යොදා ගන්නා අතර, ප්‍රේක්‍ෂක ක්‍රියාකාරකම් හා බද්ධ වූ ප්‍රදර්ශන සඳහා ඒ සඳහා ම වෙන් කොට ඇති පිටවීමේ දොරටුව ආශ්‍රිත පරිශ්‍රය භාවිතයට ගනී. ප්‍රදර්ශන පරිශ්‍රය අදාල තේමාවට ගැළපෙන පරිදි පිළියෙළ කරනු ලබයි. තාවකාලික ප්‍රදර්ශන තුළින් ප්‍රේක්‍ෂක ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානයක් යොමු කරන බැවින් වැඩි ඉඩකඩක් තුළ ප්‍රමාණවත් භාණ්ඩ උපයෝගී කර ගනිමින් ප්‍රදර්ශනය සැළසුම් කරනු

ලැබේ. ප්‍රදර්ශන භාණ්ඩ පිළිබඳ ව ප්‍රායෝගික අවබෝධයක් ලබා දීම මෙහි දී අරමුණු වන බැවින් පහසුවෙන් හැසිරවිය හැකි භාණ්ඩ ප්‍රේක්ෂක ක්‍රියාකාරකම් සඳහා භාවිතයට ගනු ලැබේ. ප්‍රදර්ශනයට අදාල අනෙකුත් භාණ්ඩ ප්‍රදර්ශන තේමාවට අනුකූලව පාදස්තල හා ආධාරක යොදා ගනිමින් ප්‍රදර්ශනය කරනු ලැබේ.

ප්‍රදර්ශන භාණ්ඩ වලට අදාල නාමයන් හා උපයෝගීතාව පිළිබඳ කෙටි එමෙන් ම ප්‍රමාණවත් විස්තරයක් ප්‍රදර්ශනය කරනු ලබයි. ප්‍රදර්ශිත භාණ්ඩ පිළිබඳ වැඩි දුර විස්තර ලබා දීම සහ ප්‍රේක්ෂක ක්‍රියාකාරම් වලට සහය ලබා දීම සඳහා පුහුණු කම්කරු සේවක මහතෙකුගේ සේවය ලබා ගෙන තිබේ.

සාම්ප්‍රදායික දඩයම් ක්‍රම ප්‍රදර්ශනයේ දී විවිධ සතුන් දඩයම් කිරීම සඳහා භාවිත කරනු ලැබූ උගුල් අටවා පෙන්නුම් කරනු ලබන අතර, ඒවා ක්‍රියාත්මක වන ආකාරය පෙන්නුම් කරනු ලැබීය. සාම්ප්‍රදායික මුළුතැන්ගෙයි උපකරණ ප්‍රදර්ශනය මඟින් හිරමණයෙන් පොල් ගෑම, සහල් ගැරීම, කුරක්කන් ඇඹරීම වැනි ක්‍රියාකාරකම් සහිතව ප්‍රදර්ශනය පැවැත්විය. සාම්ප්‍රදායික කලාවන් ප්‍රදර්ශනය තුළින් සංගීත භාණ්ඩ ප්‍රදර්ශනය කරනු ලැබූ අතර, බුම්මැඩිය වාදනය කාගේත් සිත්ගත් ප්‍රේක්ෂක ක්‍රියාකාරකමක් බවට පත් වූ අයුරු දක්නට ලැබිණි. සාම්ප්‍රදායික ජන ජීවිතය නැමති ප්‍රදර්ශනයේ දී අට්ටාලය සහිත පැලට නැගීම, වාංපතුල් පැළඳ ඇවිදීම, වරමද්ද භාවිතය, ගැමි කාන්තාවන්ගේ ඇඳුමක් වන චීත්තය ඇඳීම ප්‍රේක්ෂකයා වඩාත් සිත් ගත් අංග විය. සීගිරියෙහි පැරණි ඡායාරූප තාවකාලික ප්‍රදර්ශනය තුළින් සීගිරි අතීත මතක ප්‍රේක්ෂකයා තුළට දැනවීමට හැකි වීම විශේෂිත ය.

කෞතුකාගාරයක ස්ථිර ප්‍රදර්ශන සඳහා යොදාගනු ලබන භාණ්ඩ කිසි විටෙකත් ස්පර්ශ කිරීමට අවස්ථාව ලබා නොදෙන අතර මහජනයාට නැරඹීමේ අවකාශය පමණක් ලැබේ. නමුත් තාවකාලික ප්‍රදර්ශනයක් තුළ දී එම භාණ්ඩ ස්පර්ශ කිරීමට මෙන් ම පරිහරණය කිරීමට ද අවස්ථාව ලැබීම, ප්‍රේක්ෂකයාගේ දැනුම අවබෝධය වර්ධනය කර ගැනීමට කදිම අවස්ථාවකි. ක්‍රියාකාරකම්වල නියැලෙමින්, ඡායාරූප ලබා ගනිමින් ප්‍රේක්ෂකයා වැඩි වේලාවක් කෞතුකාගාර පරිශ්‍රය තුළ රඳවා ගැනීමට යොදා ගත හැකි කදිම උපාය මාර්ගයක් වශයෙන් තාවකාලික ප්‍රදර්ශන හඳුන්වා දිය හැකි ය. මේ පිළිබඳ සාධක තාවකාලික ප්‍රදර්ශන කුටිය අසල තබා ඇති අදහස් සටහන් කිරීමේ ග්‍රන්ථයෙන් මනාව පැහැදිලි වේ.

''නැරඹුවෙමි විසිතුරු - ලස්සනයි ගැමි දසුන්
මතකයට එයි අතීතය - අතීතය සුන්දරයි
බලමු මැන සිහියට''
(ඊ.ජී. සෝමවතී - ඇල්පිටිය)

"It is a great opportunity for everyone to enjoy the Sri Lankan Life Style & its beauty. Wonderful work"
(Lily- Canada)

**සමාලෝචනය**

තාවකාලික ප්‍රදර්ශනයන් සමාජයේ දෘෂ්‍යමාන උරුමයන් රැකගැනීම, පර්යේෂණ මඟින් එම උරුමයන් පිළිබඳ දැනුම වැඩි දියුණු කරගැනීම, විශේෂ ප්‍රදර්ශන මඟින් අධ්‍යාපනය හා අවබෝධය ලබා දීම මෙන් ම නරඹන්නන් හට දැනුම හා විනෝදාස්වාදය ලබා දෙන බව මෙම අධ්‍යයනය තුළින් පැහැදිලි වේ. මේ අනුව කෞතුකාගාර ප්‍රවර්ධන උපාය මාර්ගයක් වශයෙන් තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීම කාලෝචිත අංගයක් බව පසක් වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


හේවගේ, ආර්. 2003: කෞතුකාගාර 09 කලාපය, කෞතුකාගාර විද්‍යාව සහ ශ්‍රී ලංකාව,ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව. 1-7.